ßÚ×_´{ÚÆÆÈ À`ÑÍÓÚ
All Rights Reserved

**පළමු වාර පරීක්ෂණය 2015**

# ඉතිහාසය

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- අංක 01 05 දක්වා වූ ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

01 පැරණි රෝමවරු ඇලෙක්සැන්ඩ්‍රියා නගරය කේන්ද්‍රකොටගෙන බොහෝ රටවල් සමග වෙළඳ ගනුදෙනු කළහ. ( )

02 ග්‍රීක සාහිත්‍යයේ සුප්‍රසිද්ධ වීර කාව්‍ය දෙකක් ලෙස රාමායණය හා මහා භාරතය සළකනු ලැබේ. ( )

03 කොලෝසියම් ක්‍රීඩාගාරය අරාබි ගෘහ නිර්මාණ ශිල්පයේ අති විශිෂ්ට නිර්මාණයකි. ( )

04 ග්‍රීක පෞර රාජ්‍යවල පුරවැසියන් ලෙස සලකනු ලැබුවේ වැඩිහිටි පුරුෂයින් පමණි. ( )

05 ලෝකයේ ප්‍රථමයෙන්ම මුදල් භාවිත කර ඇත්තේ මෙසපොතේමියානු ශිෂ්ඨාචාරයේ ය. ( )

- ගැළපෙන වචන යොදා පහත අංක 06 10 දක්වා වූ ප්‍රකාශනවල හිස්තැන් පුරවන්න.

06 පැරණි මිසර දේශ වාසීහු දිරාපත් නොවීම සඳහා මෘත දේහවල රසායන ඖෂධ ගල්වා ....................................................... තුළ තැන්පත් කළහ.

07 පැරණි ග්‍රීසියේ නගර කේන්ද්‍රකොටගෙන පාලන කටයුතු සිදුකළ කුඩා ස්වාධීන පාලන ඒකක ............................................................ නමින් හඳුන්වා ඇත.

08 යම් වස්තුවක් ජලයේ පාවීමේ දී ඉවත් වන ජල ප්‍රමාණයේ බර හෙවත් ජලෝත් පීඩනය පිළිබඳ න්‍යාය ග්‍රීක විද්‍යාඥයකු වූ ................................................ විසින් සොයාගන්නා ලදී.

09 බිම්බිසාර හා අජාසත් යන රජවරුන්ගේ කාර්යය ශූර පාලනය නිසා ............................................................. අධිරාජ්‍යයක තත්ත්වයට ව්‍යාප්ත වී තිබේ.

10 මුහම්මද් නබිතුමා විසින් දේශනා කළ ධර්මය ................................................ හි සඳහන් වේ.

- අංක 11 20 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11 ඉන්දියාවේ සොළොස් මහා ජනපද අවධියේ මගධ රාජ්‍යයේ අගනුවර වූයේ,

(1) බරණැස් නුවරයි. (2) සැවැත් නුවරයි.

(3) රජගහ නුවරයි. (4) උදේනි නුවරයි.

12 බැසිලිකා දේවස්ථානය, ඩයොක්ලීෂන් අධිරාජයාගේ මාළිගය යන සුවිශේෂී ගොඩනැගිලි අයත්වන්නේ,

(1) රෝම ගෘහ නිර්මාණ ශිල්පයටයි. (2) ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පයටයි.

(3) අරාබි ගෘහ නිර්මාණ ශිල්පයටයි. (4) ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පයටයි.

13 මව් දෙවඟන පිදීම ජනප්‍රිය වන්දනාවක් ලෙස ක්‍රියාත්මකව පැවතුනේ,

(1) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ය.

(2) හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරයේ ය.

(3) මෙසපොතේමියානු නිම්න ශිෂ්ටාචාරයේ ය.

(4) නයිල් නිම්න ශිෂ්ටාචාරයේ ය.

14 රෝමයේ පිහිටි ප්‍රධාන ආගමික ගොඩනැගිල්ලක් නම්,

(1) පාතිනොන් දේවාලයයි. (2) ශිගුරාත් දේවස්ථානයයි.

(3) බැසිලිකා දේවස්ථානයයි. (4) ඩයොක්ලීෂන් මැඳුරයි.

15 ග්‍රීක්වරුන් ශ්‍රී ලංකාව හැඳින්වීම පිණිස යොදාගත් නම

(1) සෙරෙන්ඩිබ් (2) තැප්‍රොබේන් (3) සෙයිලාවෝ (4) තම්බපණ්ණි

16 පැරණි ඉන්දියාවේ පැවැති සමාජ සංවිධාන ක්‍රමය අනුව අධ්‍යාපන කටයුතු හා ආගමික කටයුතු පිළිබඳ වගකීම පැවරී තිබුණේ,

(1) බ්‍රාහ්මණයින්ටයි. (2) ක්‍ෂත්‍රියයින්ටයි.

(3) වෛශ්‍යයින්ටයි. (4) ශුද්‍රයින්ටයි.

17 වර්තමාන රෝම නීති ක්‍රමයට පදනම වූ ජස්ටීනියන් නීති පද්ධතිය සකස් කරන ලද රෝම පාලකයා වන්නේ,

(1) කොන්ස්ටන්ටයින් අධිරාජයායි. (2) නීරෝ අධිරාජයායි.

(3) ජූලියස් සීසර් අධිරාජයායි. (4) ජස්ටීනියන් අධිරාජයායි.

18 ප්‍රශ්න හා පිළිතුරු මගින් ශිෂ්‍යයින්ට කරුණු අවබෝධ කරවීමේ ඉගැන්වීම් ක්‍රමය හඳුන්වා දෙන ලද ග්‍රීක දාර්ශනිකයා

(1) සොක්‍රටීස් (2) ඇරිස්ටෝටල් (3) ප්ලේටෝ (4) යුක්ලිඩ්

19 හොවැංහෝ නදී නිම්න ශිෂ්ටාචාරය ආරම්භ වීම හා වර්ධනය වීම සිදුවූයේ,

(1) අප්‍රිකාවේ ඊජිප්තුවේ ය.

(2) ආසියාවේ නැගෙනහිර චීනයේ ය.

(3) නිරිතදිග ආසියාවේ බැබිලෝනියාවේ ය.

(4) දකුණු ආසියාවේ ඉන්දියාවේ ය.

20 ''දිසාපාමොක්'' නම් සුප්‍රසිද්ධ ආචාර්යවරයෙක් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ කටයුතු

The National e-learning Portal for The General Education

කරගෙන ගිය බව සඳහන් වන්නේ,

(1) රෝමයේ ය.(2) ග්‍රීසියේ ය. (3) අරාබියේ ය. (4) ඉන්දියාවේ ය.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

01 (1) ඉතිහාසය විෂය භාර ගුරුතුමා / ගුරුතුමිය පළමුවන වාරයේ ඔබේ පන්තියට පැවරූ ඇගැයීම් ක්‍රියාකාරකම කුමක් ද?

(2) ඒ සඳහා ප්‍රයෝජනයට ගත් පාඩම් මාතෘකාවක් ලියන්න.

(3) මෙම ඇගැයීම සඳහා ගුරුතුමා / ගුරුතුමිය දුන් උපදෙසක් ඉදිරිපත් කරන්න.

(4) කණ්ඩායම් නිර්මාණය සකස් කළ ආකාරය පැහැදිලි කරන්න.

(5) පන්තියේ සෙසු අයගේ ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කළ ආකාරය විස්තර කරන්න.

(6) නිර්මාණයේ දක්නට තිබූ දුර්වලතාවයක් හෝ විශේෂතාවයක් සඳහන් කරන්න.

(7) ඔබ හඳුනාගත් දුර්වලතාවයක් ඊළඟ අවස්ථාවකදී මඟහරවා ගැනීම පිණිස අනුගමනය කළහැකි උපක්‍රමයක් ලියන්න.

(8) වඩා සාර්ථක නිර්මාණයක් ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියා කළහැකි ආකාරය ගැන ඔබේ අදහස් පැහැදිලි කරන්න. (2 x 8 = 16)

02 (1) යුප්‍රටීස් ටයිග්‍රීස් නිම්න ශිෂ්ටාචාරය හැඳින්වීම සඳහා අතීතයේ භාවිතා කර ඇති වෙනත් නම් දෙකක් ලියන්න.

(2) (a) හමුරාබි ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

(b) එහි සඳහන්වන ආඥාවක් ලියන්න.

(3) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට සම්බන්ධව කියැවෙන පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| ගෘහ නිර්මාණ ශිල්පයේ වැදගත්ම ගොඩනැගිල්ල | ........................................ |
| [illegible] භාවිත කළ අක්ෂර ක්‍රමය | ........................................ |
| වන්දනාමාන කළ දෙවි කෙනෙක් | ........................................ |
| පැරණි ලෝකයේ පුදුම හතෙන් එකක් | ........................................ |
| කළු ගලෙන් නෙලා ඇති තේජාන්විත රාජ ප්‍රතිමාව | ........................................ |

03 (1) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට සම්බන්ධව පැවැති ප්‍රධාන නගර දෙකක් නම් කරන්න.

(2) ඉහත නගර ඉතා ක්‍රමානුකූලව හා විධිමත් ලෙස නිර්මාණය කර තිබූ බව

දැක්වෙන කරුණු 2 ක් ලියන්න.

(3) ඉහත ශිෂ්ටාචාරයේ ජනයා ප්‍රයෝජනයට ගත් ආහාර වර්ග, ආහාර පිළියෙල කරගත් ආකාරය යන කරුණු පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන්න.

04 (1) ඉන්දියාවේ ගෝත්‍ර අවධිය පිළිබඳව තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර 2 ක් නම් කරන්න.

(2) බිම්බිසාර රජතුමා සිය රාජ්‍යයේ වඩා ක්‍රමානුකූල පාලනයක් ගෙනයාම සඳහා අනුගමනය කළ පියවර 2 ක් ලියන්න.

(3) (a) ඉස්ලාම් ධර්මයේ ආදි කර්තෘවරයා කවුරුන්ද?

(b) එතුමා ඉපදුනේ කවර රටක කවර නගරයකද?

(c) එම ආගමේ ඉගැන්වීම් 2 ක් ලියන්න.

05 (1) ... ඉදිරිපත් ... දෙකකට ... අයත් ... පිළිවෙළින් ...



A



B

(2) රෝමවරුන් විසින් ලොවට හඳුන්වා දෙන ලද නීති පද්ධතියේ ප්‍රධාන ලක්ෂණ 2 ක් ඉදිරිපත් කරන්න.

(3) ඊජිප්තුවේ වාසය කළ ජනයාගේ ආගමික 3 ක් ලියන්න.



1

06 (1) (a) මේ සමග ඇති අංක 1 පින්තූරයේ දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

(b) එය කරවන ලද්දේ කවරකු වෙනුවෙන් ද?

(2) (a) ග්‍රීක්වරුන්ගේ වන්දනාමානවලට ලක්වූ වෙනත් දෙවිවරුන් දෙදෙනෙක් නම් කරන්න.

(b) ග්‍රීක සාහිත්‍යයේ සුප්‍රසිද්ධ වීර කාව්‍ය දෙකකි. ඒවා මොනවාද?

(3) රෝම අධිරාජ්‍යය බිඳවැටීමට තුඩුදුන් හේතු 3 ක් ලියන්න.